අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

33 - ගිණුම්කරණය I | **පැය දෙකයි**

සැලකිය යුතුයි :

★ අංක 1 සිට 30 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

★ අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු සපයන්න.

01. විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත දී ඇති කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදිවේ ද?

A එය බාහිර පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සපයයි.

B එය ආයතනයක කළමනාකරණ තොරතුරු පද්ධතියේ කොටසකි.

C එය ආයතනයේ සංවිධානාත්මක මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීමට හා පාලනයට පිළියෙල කරයි.

(1) A පමණි.

(2) B පමණි.

(3) A සහ B පමණි.

(4) B සහ C පමණි.

(5) A, B, C සියල්ලම වේ. (.............)

02. පහත දැක්වෙන්නේ **නිපුනි** ව්‍යාපාරයේ 2016/01/01 දිනට තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වටිනාකමය.

ජංගම වත්කම්	+ ජංගම නොවන වත්කම්	= ජංගම වගකීම්	+ ජංගම නොවන වගකීම්	+ හිමිකම්
100 000	400 000	200 000	50 000	250 000

2016 ජනවාරි 02 පහත සඳහන් ගනුදෙනු සිදු වී ඇත.

(i) 15%ක් VAT සහිතව රු 34 500කට භාණ්ඩ ණයට විකිණීම. (දළ ලාභ අනුපාතිකය VAT පෙර විකුණුම් මිල මත 20%කි.)

(ii) රු 2 000ක ණය පොලිය ඇතුළත් ව රු 20 000ක බැංකු ණය වාරිකයක් මුදලින් ගෙවීම.

ඉහත ගනුදෙනුවලින් පසු නිවැරදි සමීකරණය කුමක් ද?

	ජංගම වත්කම්	+ ජංගම නොවන වත්කම්	= ජංගම වගකීම්	+ ජංගම නොවන වගකීම්	+ හිමිකම්
(1)	+ 80 000	+ 400 000	= + 200 000	+ 50 000	+ 230 000
(2)	+ 85 000	+ 400 000	= + 200 000	+ 32 000	+ 253 000
(3)	+ 85 000	+ 400 000	= + 200 000	+ 30 000	+ 257 500
(4)	+ 89 500	+ 400 000	= + 204 500	+ 32 000	+ 250 000
(5)	+ 90 500	+ 400 000	= + 204 500	+ 32 000	+ 254 000

(.............)

03. ගිණුම් වර්ගීකරණය සම්බන්ධයෙන් දී ඇති පහත වගුවෙහි නිවැරදි වර්ග කිරීම් පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

		වත්කම් ගිණුමකි	වගකීම් ගිණුමකි	හිමිකම් ගිණුමකි	ආදායම් ගිණුමකි	වියදම් ගිණුමකි
(1)	ආපසු එවුම් ගිණුම	√				
	ගැනුම් ගිණුම					√
(2)	ගැනිලි ගිණුම			√		
	ගැනුම් ගිණුම					√
(3)	ගැනිලි ගිණුම					√
	ආපසු යැවුම් ගිණුම					√
(4)	බොල් ණය ගිණුම					√
	අඩමාන ණය වෙන් කිරීමේ ගිණුම		√			
(5)	ක්ෂය වීම් ගිණුම					√
	ක්ෂය වෙන් කිරීමේ ගිණුම				√	

(.............)

04. රු 20 000ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් පිරිවැයට 25%ක ලාභයක් සහිතව ණයට විකුණන ලදී. මෙම ගනුදෙනුව වාර්තා කිරීමට අදාළ නිවැරදි පිළිතුර කුමක් ද?

	මූලික ලියවිල්ල	**මූලික සටහන් පොත**	**ද්විත්ව සටහන**		
(1)	ඉන්වොයිසිය	මුදල් පොත	ණයගැති ගිණුම හර	25 000	
			විකුණුම් ගිණුම බැර		25 000
(2)	ඉන්වොයිසිය	විකුණුම් ජර්නලය	ණයගැති ගිණුම හර	25 000	
			විකුණුම් ගිණුම බැර		25 000
(3)	ඉන්වොයිසිය	විකුණුම් ජර්නලය	විකුණුම් ගිණුම හර	25 000	
			ණයගැති ගිණුම බැර		25 000
(4)	ලදුපත	මුදල් පොත	මුදල් පොත හර	25 000	
			විකුණුම් ගිණුම බැර		25 000
(5)	වවුචරය	විකුණුම් ජර්නලය	ණයගැති ගිණුම හර	25 000	
			විකුණුම් ගිණුම බැර		25 000

(.............)

05. **කුමුදු ව්‍යාපාරිකයෝ** 2016/01/01 දින **සුමුදු සමාගමට** රු 75 000ක් වටිනා භාණ්ඩ ණයට විකුණන ලදී. රු 2 000ක් වටිනා භාණ්ඩ ප්‍රවාහනයේදී පළුදු වී ඇති බැවින් 2016/01/04 දින ආපසු එවන ලදී. සුමුදු සමාගම රු 30 000ක මුදලක් චෙක්පතකින් ගෙවන ලදී.
ඉහත ගනුදෙනු සඳහා කුමුදු ව්‍යාපාරිකයින් විසින් භාවිතා කළ යුතු මූලාශ්‍ර ලේඛන පිළිවෙළින් දක්වා ඇති පිළිතුර කුමක්ද?
(1) හරපත, ඉන්වොයිසිය, වවුචරය
(2) ඉන්වොයිසිය, බැරපත, ලදුපත
(3) බැරපත, ලදුපත, ඉන්වොයිසිය
(4) ඉන්වොයිසිය, හරපත, බැංකු විස්තරය
(5) ඉන්වොයිසිය, බැරපත, වවුචරය (.............)

06. ව්‍යාපාරයක 2016.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු 80 000කි. එදිනට ණයගැති ලෙජරයේ ශේෂ එකතුව මීට වඩා වෙනස් වූ අතර එම වෙනසට පහත හේතු බලපා ඇත.
1. විකුණුම් ජර්නලයේ එකතුව රු 2 000කින් අඩු වී ඇත.
2. ණයට විකුණුම් රු 20 000ක් විකුණුම් ජර්නලයේ සටහන් වී ඇත්තේ රු 2 000ක් ලෙසය.
3. රු 4 500ක ණයට විකුණුම් අදාළ ණයගැති ගිණුමට පිටපත් කර ඇත්තේ රු 5 400ක් ලෙසය.
4. දුන් වට්ටම් රු 500ක් ණයගැති ලෙජරයේ පෞද්ගලික ගිණුමේ සටහන් කර නොමැත.

2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කළ යුතු ණයගැති ශේෂය වනුයේ,
(1) රු 79 100කි. (2) රු 88 600කි. (3) රු 98 000කි.
(4) රු 98 600කි. (5) රු 100 000කි. (.............)

07. **මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව** පහත කුමන ද වගකීමක ලක්ෂණ වන්නේද?
A - එය හා සම්බන්ධව ආයතනයට වර්තමාන බැදීමක් පැවතීම.
B - එහි වටිනාකම හෝ බේරුම් කළ හැකි අගය විශ්වාසනීය ලෙස මැනිය හැකිවීම.
C - එය පියවීමේදී අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන දෙන සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලායෑමේ හව්‍යතාවයක් පැවතීම.
(1) A පමණි. (2) A සහ B පමණි. (3) A සහ C පමණි.
(4) C පමණි. (5) A, B සහ C සියල්ලම වේ. (.............)

08. 2000 වර්ෂයේදී රු 2 000 000කට මිලදීගත් ඉඩමක් 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු 5 000 000ක් වූ ප්‍රත්‍යාගණන වටිනාකමට වාර්තා කර ඇත. මෙම අවස්ථාවේදී අනුගමනය කර **නොමැති** ගිණුම්කරණ සංකල්පය හා **ප්‍රත්‍යාගණන වටිනාකම වාර්තා කිරීමෙන්** පිළිබිඹු වන ගුණාත්මක ලක්ෂණය කුමක්ද?

	සංකල්පය	ගුණාත්මක ලක්ෂණය
(1)	ඒකක	අදාළ බව
(2)	ගැලපුම්	විශ්වාසනීය නියෝජනය
(3)	ඓතිහාසික පිරිවැය	අවබෝධ කරගත හැකි බව
(4)	ඓතිහාසික පිරිවැය	සංසන්දනාත්මක බව
(5)	ඓතිහාසික පිරිවැය	අදාළ බව

(.............)

[3වන පිටුව බලන්න.

09. සමාගමක **තොග** සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සපයා ඇත.

දිනය	විස්තරය	මුළු වටිනාකම රු 000	ඒකක ගැනුම් මිල රු	ඒකක විකුණුම් මිල රු
2016/01/01	තොගය	1 500	15	-
2016/01/05	ගැනුම්	4 000	20	-
2016/01/10	විකුණුම්	3 500	-	35
2016/01/15	ණයගැතියන් විසින් ආපසු එවුම්	700	-	-
2016/01/20	ගැනුම්	2 500	25	-
2016/01/30	විකුණුම්	2 000	-	25

- ප්‍රථම ලැබීම ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට (FIFO) තොග නිකුත් කිරීම කරනු ලබයි.

2016.01.31 දිනට **ඉතිරි තොග වටිනාකම** හා 2016.01.31 දිනෙන් අවසන් මාසයට අදාළ **දළ ලාභය** පිළිවෙළින්,

	ඉතිරි තොගය (රු 000)		**දළ ලාභය (රු 000)**
(1)	3 200	හා	4 100 කි.
(2)	3 500	හා	5 500 කි.
(3)	4 500	හා	3 100 කි.
(4)	5 300	හා	2 100 කි.
(5)	7 000	හා	4 500 කි.

(.............)

10. **පියුමාල්ගේ ව්‍යාපාරයේ** 2016 ජනවාරි මස සිදුවූ ගනුදෙනු සහ අතිරේක තොරතුරු පහත දැක්වේ.

- භාණ්ඩ ණයට ගැනුම් රු 20 000ක් වන අතර මාසය තුළ මේවායින් පිරිවැය රු 15 000ක් වූ භාණ්ඩ ණයට විකුණා ඇත.
- බොල් ණය කපා හැරීම රු 3 000කි. පසුගිය වර්ෂයේ කපා හරින ලද රු 1 000ක බොල් ණයක් ජනවාරි මාසය තුළ දී ආපසු ලැබී ඇත.
- ජනවාරි මාසය සඳහා ලද විදුලි බිල්පත රු 5000කි. එය ගෙවන ලද්දේ 2016 පෙබරවාරි 10 වන දිනදීය.
- 2016 ජනවාරි මාසයට අදාළ වේතන රු 10 000ක් එම මාසය තුළ ගෙවා නොමැති අතර 2015 දෙසැම්බර් මාසයට අදාළ වේතන රු 8 000ක් ගෙවා ඇත.

ඉහත ව්‍යාපාරයේ 2016 ජනවාරි මාසය සඳහා ආදායමට එරෙහිව ගැලපිය යුතු මුළු වියදම කොපමණද?

(1) රු 24 000 (2) රු 25 000 (3) රු 32 000
(4) රු 36 000 (5) රු 41 000 (.............)

11. **නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වා නොගන්නා** ව්‍යාපාරයක 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අනාවරණය කරගෙන ඇත.

	රු
විකුණුම්	500 000
ගැනුම්	400 000
ගැනිලි - මුදල්	30 000
- භාණ්ඩ	70 000
2016.03.31 තොගය	80 000

- දළ ලාභ අනුපාතය 40%කි.

2015.04.01 දින තොග වටිනාකම වන්නේ ;

(1) රු 20 000කි. (2) රු 50 000කි. (3) රු 80 000කි.
(4) රු 90 000කි. (5) රු 120 000කි. (.............)

12. **ශක්ති ක්‍රීඩා සමාජයේ** 2016.03.31 දිනට සාමාජික සංඛ්‍යාව 150කි. ඉන් 50 දෙනෙකු යාවජීව සාමාජිකයන්ය. ඉතිරි එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු 1 000කි. සාමාජිකයින් 12 දෙනෙකු 2015/16 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නැත. සාමාජිකයින් 8 දෙනෙකු 2016/17 වර්ෂය සඳහා ද සාමාජික මුදල් ගෙවා ඇත. යාවජීව සාමාජික මුදල් ගිණුමේ 2015/04/01 දිනට ශේෂය රු 200 000කි. ඉන් 10%ක ප්‍රමාණයක් 2015/16 වර්ෂයේ සාමාජික මුදල් ආදායම් ලෙස ආදායම් හා වියදම් ගිණුමට මාරු කරනු ලැබේ. වසර මුල දී හිඟ හිටි හෝ ඉදිරියට ලද සාමාජික මුදල් නොපැවතුණි.

2015/16 වර්ෂය තුළ ආදායම් ලෙස හඳුනාගන්නා සාමාජික මුදල් වටිනාකම හා වර්ෂය තුළ ලද සාමාජික මුදල කොපමණද?

	ආදායම ලෙස හඳුනාගන්නා වටිනාකම (රු)	**වර්ෂය තුළ ලද සාමාජික මුදල (රු)**
(1)	96 000	120 000
(2)	120 000	100 000
(3)	120 000	96 000
(4)	120 000	120 000
(5)	150 000	96 000

(.............)

▲ **ප්‍රශ්න අංක 13, 14 හා 15ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

හැරී, **ඩැනී** හා **විලී** විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වසර සඳහා පිළියෙල කළ ලාභ විසර්ජන ප්‍රකාශය පහත දැක්වේ.

(රු 000)

කාලච්ඡේදයේ ශුද්ධ ලාභය			1 200
ප්‍රාග්ධන පොලී	- හැරී	200	
	- ඩැනී	100	
	- විලී	100	(400)
වේතන	- හැරී	100	
	- ඩැනී	100	(200)
ලාභ කොටස්	- හැරී	300	
	- ඩැනී	200	
	- විලී	100	(600)
			-

* 2015.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ ජංගම ගිණුමේ ශේෂයන් පහත දැක්වේ.

		(රු)
හැරී	-	20 000
ඩැනී	-	40 000
විලී	-	50 000

* ප්‍රවර්තන වර්ෂය තුළ දී හැරී විසින් රු 80 000 ගැනිලි සිදු කර ඇත.

* හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 5% වාර්ෂික පොලියක් හිමි විය යුතුය. 2015.10.01 දින ඩැනී ප්‍රාග්ධන පොලී ලෙස රු 50 000ක් මුදලින් ආපසු ගෙන ඇත.

* 2015.04.01 දින ඩැනී හවුල් ව්‍යාපාරයට රු 60 000ක වාර්ෂික කුලියට මෝටර් රථයක් ලබා දී ඇත. 2016.03.31 දින වන විට වාර්ෂික කුලිය ගෙවා නොතිබූ අතර එය ආදායම් ප්‍රකාශනයේ නිවැරදිව වාර්තා කර ඇත.

* 2016.03.31 දින විලී හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර, එදින මුළු කීර්තිනාමය රු 600 000ක් ලෙස ආගණනය කර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීමට එකඟ විය. විලීට ගෙවිය යුතු හිමිකම ණය ගිණුමකට මාරු කරන ලදී.

* නව හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ බෙදා ගැනීමේ අනුපාතය හැරී හා ඩැනී අතර පිළිවෙළින් 2:1 වේ.

13. 2016.03.31 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ශේෂයන් වන්නේ

	හැරී (රු'000)	**ඩැනී (රු'000)**
(1)	500	400
(2)	540	450
(3)	540	500
(4)	620	440
(5)	620	500

(.............)

[5වන පිටුව බලන්න.

14. 2016.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් වන්නේ ;

	හැරී (රු 000)		ඩැනී (රු 000)	
(1)	1 300	සහ	1 200කි.	
(2)	1 900	සහ	1 000කි.	
(3)	3 900	සහ	2 000කි.	
(4)	3 900	සහ	2 200කි.	
(5)	4 200	සහ	2 200කි.	(.............)

15. 2016.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම හා ණය පිළිවෙළින් ;

	හිමිකම (රු 000)	ණය (රු 000)	
(1)	990	250	
(2)	5 900	2 100	
(3)	5 900	2 300	
(4)	5 900	0	
(5)	6 890	2 350	(.............)

16. "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි සම්බන්ධ ප්‍රමිතියට (LKAS 8) අනුව පහත සඳහන් ඒවායින් ඇස්තමේන්තු වෙනස්වීම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත හැක්කේ මොනවාද?

A - පෙර වර්ෂයෙහි කපාහරින ලද රු 50 000ක ණයගැතියෙකුගේ ණය ප්‍රවර්ථන වර්ෂයේදී ලැබීම.

B - තොග අගය කිරීමේ FIFO (ප්‍රථම පැමිණි ප්‍රථම පිට) ක්‍රමය වෙනුවට ප්‍රවර්ථන වර්ෂයේ සිට WAC (බර තැබූ සාමාන්‍ය පිරිවැය) ක්‍රමය යොදා ගැනීම.

C - ප්‍රවර්තන වර්ෂයේ සිට දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට මාරු කිරීම.

D - ගොඩනැගිලි නවීකරණය හේතුවෙන් එහි ඵලදායි ජීවකාලය වසර 10 සිට වසර 12 දක්වා වැඩිවන බව තීරණය කිරීම.

ඉහත සඳහන් ඒවායින් ඇස්තමේන්තු වෙනස්වීම් ලෙස හඳුනා ගැනෙන්නේ ;

(1) A සහ C පමණි.
(2) A සහ D පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, C සහ D පමණි.
(5) B, C සහ D පමණි. (.............)

- **2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මාලිත පොදු සමාගමට අදාළ තොරතුරු ප්‍රශ්න අංක 17 සහ 18ට පිළිතුරු සැපයීමට භාවිත කරන්න.**

	රු'000
කාලච්ඡේදයේ ලාභය	1 400
මෙහෙයුම් වියදම්	900
ලාභාංශ ගෙවීම්	100
රඳවාගත් ඉපයුම් (2015.04.01)	1 800
යන්ත්‍ර ප්‍රත්‍යාගණන සංචිතය (2015.04.01)	300
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	2 000

* 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ යන්ත්‍ර ප්‍රත්‍යාගණනයෙන් රු 200 000 අලාභයක් වාර්තා කර ඇති අතර, මෝටර් රථ ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනයෙන් රු 100 000 ලාභයක් වාර්තා වේ.

17. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **වෙනත් විස්තීර්ණ ආදායම්** හා **මුළු විස්තීර්ණ ආදායම** කොපමණද?

	වෙනත් විස්තීර්ණ ආදායම් රු'000	මුළු විස්තීර්ණ ආදායම් රු'000	
(1)	(100)	1 600	
(2)	(100)	1 300	
(3)	200	1 600	
(4)	(300)	1 400	
(5)	500	1 500	(.............)

[6වන පිටුව බලන්න.

18. 2016.03.31 දිනට සමාගමේ ප්‍රත්‍යාගණන සංචිතය හා එදිනට සමාගමේ මුළු හිමිකම

	ප්‍රත්‍යාගණන සංචිතය රු'000	**මුළු හිමිකම රු'000**
(1)	100	3 900
(2)	200	3 900
(3)	200	5 400
(4)	300	5 500
(5)	400	5 400

(.............)

19. සීමිත **සුලෝචන පොදු** සමාගමේ 2016.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

	රු'000	
	හර	**බැර**
ආදායම් බදු ගෙවීම - 2015/2016	300	
- 2014/2015	285	
ආදායම් බදු සඳහා වෙන් කිරීම (2014/2015)		350

2014/2015 වර්ෂය සඳහා ආදායම් බද්ද රු 325 000ක් විය යුතු බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග එකඟ වී ඇත. 2016/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් බද්ද රු 350 000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

ඉහත තොරතුරු ඇසුරෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතු නිවැරදි අගයන් මොනවාද?

	ආදායම් බදු වියදම	**ආදායම් බදු වගකීම**
(1)	325 000	50 000
(2)	325 000	65 000
(3)	325 000	90 000
(4)	350 000	65 000
(5)	350 000	90 000

(.............)

20. 2015.04.01 දිනට **සීමිත "මයුරි" පොදු සමාගමේ** නිකුත් කළ සාමාන්‍ය කොටස් ගණන 400 000ක් ද ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු 10 000 000ක් ද විය. 2015.10.01 දින එදිනට තිබූ සෑම සාමාන්‍ය කොටස් 4කට 1 බැගින් කොටසක් රු 25 බැගින් සංචිත ප්‍රාග්ධනිත කිරීමත් සිදු කරන ලදී.
තවද, 2016.03.01 දින එදිනට පැවති සෑම සාමාන්‍ය කොටස් 5කටම 1 බැගින් කොටසක මිල රු 20 බැගින් වූ හිමිකම් නිකුතුවක් සිදු කරන ලදී. කොටස්කරුවන් විසින් සියලුම හිමිකම් ලබාගන්නා ලදී.

මෙම ගනුදෙනු හේතුවෙන් 2016.03.31 දිනට සමාගමේ හිමිකමෙහි වැඩිවීම හෝ අඩුවීම කොපමණ ද?
(1) රු 2 000 000 කින් වැඩිවේ. (2) රු 2 000 000කින් අඩුවේ. (3) රු 2 500 000කින් වැඩිවේ.
(4) රු 4 500 000කින් වැඩිවේ. (5) රු 4 500 000 කින් අඩුවේ. (.............)

21. පහත දැක්වෙන කුමන ඇ සමාගමක මුළු හිමිකම වෙනස්වීම සඳහා අදාළ **නොවේද**?
A කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම
B උපචිත විගණන ගාස්තු සටහන් කිරීම
C සංචිත ප්‍රාග්ධනිත කිරීම
D හිමිකම් නිකුතුවක් සිදු කිරීම
E සාමාන්‍ය කොටස් හිමියන්ට අවසාන ලාභාංශයක් යෝජනා කිරීම
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා E පමණි.
(4) B හා C පමණි. (5) C හා E පමණි. (.............)

22. **සුභ සාධක සංගමයක** 2015 ගිණුම් වර්ෂයට අදාළ තොරතුරු කිහිපයක් පහත දක්වා ඇත.

	2015/12/31	**2015/01/01**
සමුච්චිත අරමුදල	420 000	350 000
හිඟ හිටි සාමාජික මුදල	30 000	20 000

අතිරේක තොරතුරු :
1. සමිතිය විසින් වර්ෂය තුළ වියදම් කළ මුදල රු 120 000කි.
2. වර්ෂය තුළ ලද පරිත්‍යාග රු 50 000 කි.
3. වර්ෂය තුළ ලද සාමාජික මුදල් රු 50 000 කි.
4. සමිතිය විසින් ආපන ශාලාවක් පවත්වා ගෙන යනු ලබයි.

2015/12/31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආපන ශාලාවෙන් ලද ලාභය වනුයේ,
(1) රු 80 000කි. (2) රු 90 000කි. (3) රු 100 000කි.
(4) රු 130 000කි. (5) රු 140 000කි. (.............)

[7වන පිටුව බලන්න.

23. සීමිත **දේශාන්** සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

	2016/3/31 දිනට රු.	2015/3/31 දිනට රු.
තොගය	240 000	160 000
වෙළෙඳ ලැබිය යුතු දෑ	40 000	60 000

I 2016/03/31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් රු 800 000ක් වන අතර ඒවායින් ණයට විකුණුම් රු 500 000කි.
II දළ ලාභ අනුපාතය 25%කි.

2016/03/31 දිනෙන් අවසන් වර්ෂයේ **තොග පිරිවැටුම් අනුපාතය** හා **ණයගැති පිරිවැටුම් අනුපාතය** වන්නේ ;

	තොග පිරිවැටුම් අනුපාතය		ණයගැති පිරිවැටුම් අනුපාතය
(1)	2.5	සහ	12.5 ය.
(2)	3	සහ	10 ය.
(3)	3	සහ	16 ය.
(4)	4	සහ	10 ය.
(5)	4	සහ	16 ය.

(.............)

24. **"සරසි"** මල් පෝච්චි නිෂ්පාදන ව්‍යාපාරයේ 2016 මාර්තු මාසයේ වැටුප් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

	රු
සේවකයින්ට ගෙවූ වැටුප	83 000
සේවකයින්ගේ වැටුපෙන් අඩුකර ගැනීම්	
උත්සව අත්තිකාරම්	12 000
වැටුප් අත්තිකාරම්	15 000
EPF	10 000
සේව්‍ය දායකත්වයන්	
EPF	15 000
ETF	3 000

2016 මාර්තු මාසයේ සේවක දළ වැටුප සහ ආයතනයේ සේවකයින් සම්බන්ධ මුළු වියදම කුමක් ද?

	සේවක දළ වැටුප (රු)	සේවකයින් සම්බන්ධ මුළු වියදම (රු)
(1)	83 000	101 000
(2)	101 000	83 000
(3)	102 000	83 000
(4)	120 000	138 000
(5)	138 000	120 000

(.............)

25. පහත සඳහන් ඒවායින් ආර්ථික ඇනවුම් ප්‍රමාණ ආකෘතියට (EOQ) අදාළ නිවැරදි උපකල්පන මොනවා ද?
A ස්ථිර වූත් දන්නා වූත් තොග ලබාගැනීමේ පිරිවැයක් ඇති බව.
B ස්ථිර වූත් දන්නා වූත් රඳවා ගැනීමේ පිරිවැයක් ඇති බව.
C ඇනවුම් කරන මුළු ප්‍රමාණයම එක්වර ලැබෙන බව.
D යළි ඇනවුම් මට්ටමට පැමිණි විගස යළි තොග ලබාගන්නා බව.

(1) A සහ B පමණි. (2) A, B සහ C පමණි. (3) A, B සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D යන සියල්ලම වේ. (.............)

26. **රුවන්ගි** නිෂ්පාදන ව්‍යාපාරයේ නිෂ්පාදනය කරන ලී සෙල්ලම් කරත්ත සම්බන්ධ පොදු කාර්ය පිරිවැය තොරතුරු පහත දැක්වේ.

	සත්‍ය	ඇස්තමේන්තු ගත
මුළු පොදු කාර්ය පිරිවැය	රු. 160 000	රු. 200 000
මුළු සෘජු ශ්‍රම පැය ගණන	10 000	8 000
ඒකකයක් නිපදවීමට ගත වන සෘජු ශ්‍රම පැය ගණන	2	3

- පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ **සෘජු ශ්‍රම පැය පදනම** අනුවය.

ඒකකයක් සඳහා අන්තර්ග්‍රහණය වන පොදුකාර්ය පිරිවැය වටිනාකම වන්නේ ;
(1) රු 32 කි. (2) රු 40 කි. (3) රු 48 කි. (4) රු 50 කි. (5) රු 75 කි.
(.............)

[8වන පිටුව බලන්න.

27. පහත සඳහන් පිරිවැය වර්ග අතුරෙන් **"තොග තක්සේරුව"** සඳහා භාවිත කරන පිරිවැය මොනවාද?
    A - සෘජු නිෂ්පාදන පිරිවැය
    B - නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය
    C - ආවස්ථික පිරිවැය
    D - නිෂ්පාදන නොවන පිරිවැය

    (1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
    (4) A, B සහ C පමණි. (5) A, B, C සහ D යන සියල්ලම වේ. (.............)

28. අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට සමච්ඡේදන ලක්ෂ්‍යය (BEP) සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශ අතුරින් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
    (1) විකුණුම් පරිමාව වැඩිවීම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය අඩුවේ.
    (2) මුළු ස්ථාවර පිරිවැය අඩුවීම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය අඩුවේ.
    (3) ඒකකයක විකුණුම් මිල ඉහළ යෑම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය අඩුවේ.
    (4) ඒකකයක විචල්‍ය පිරිවැය වැඩිවීම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය වැඩිවේ.
    (5) විකුණුම් පරිමාව වැඩිවීම නිසා සමච්ඡේදන ඒකක ප්‍රමාණය වෙනස් නොවේ. (.............)

29. සමාගමක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත X භාණ්ඩයට අදාළ නිෂ්පාදන මට්ටම හා මුළු පිරිවැය පහත දී ඇත.

නිෂ්පාදන මට්ටම (ඒකක)	මුළු පිරිවැය (රු)
5000	500 000
6000	540 000

ඒකක විචල්‍ය පිරිවැය හා **මුළු ස්ථාවර පිරිවැය** පිළිවෙළින්

	ඒකක විචල්‍ය පිරිවැය (රු)		**මුළු ස්ථාවර පිරිවැය (රු)**
(1)	40	හා	200 000 කි.
(2)	40	හා	300 000 කි.
(3)	50	හා	300 000 කි.
(4)	90	හා	200 000 කි.
(5)	100	හා	300 000 කි.

(.............)

30. සමාගමක් නව මාදිලියේ මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීමට සැලසුම් කරමින් සිටී. මෙම යන්ත්‍රයට අදාළ ව පහත සඳහන් තොරතුරු සපයා ඇත.

	රු'000
A - යන්ත්‍රය අත්පත් කර ගැනීමේ පිරිවැය	3 000
B - සවිකිරීමේ ගාස්තු	400
C - යන්ත්‍රයේ වාර්ෂික ක්ෂය	300
D - බිම් සකස් කිරීමේ වියදම්	200
E - යන්ත්‍රය මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද වෙළඳ පල සමීක්ෂණ පිරිවැය	100

ඉහත තොරතුරුවලින් **මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම සඳහා** කුමන අයිතම අඩංගු කෙරේ ද?

(1) A, B හා C පමණි. (2) A, B හා D පමණි. (3) A, B හා E පමණි.
(4) A, C හා D පමණි. (5) A, B, C, D සහ E යන සියල්ලම වේ. (.............)

31. ව්‍යාපාරයක පහත ගනුදෙනු හේතුවෙන් **වත්කම්, වගකීම්** හා **හිමිකම්** සඳහා වන බලපෑම "අඩුවේ", "වැඩිවේ", "වෙනස් නොවේ" ලෙස දක්වන්න.

		වත්කම්	වගකීම්	හිමිකම්
(1)	අයිතිකරු තම පෞද්ගලික මුදලින් උපචිත වියදමක් ගෙවීම	....	....	....
(2)	ණයගැතියන්ගෙන් අඩමාන ණය සඳහා වෙන් කිරීම	....	....	....
(3)	බැංකු අයිරාවක් පවතින විට බැංකුවේ මුදල් තැන්පත් කිරීම	....	....	....
(4)	ඉදිරියට ලද ගොඩනැගිලි කුළී	....	....	....

32. ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

			රු
සුළු මුදල් පොතේ ශේෂ	-	2016.01.01	600
	-	2016.01.31	400
ප්‍රතිපූරණය කිරීම		2016.01.01	1 900

සුළු මුදල් අග්‍රිමය රු 500කින් වැඩි කරමින් 2016.02.01 දින ප්‍රතිපූරණය කළ මුදල කොපමණ ද?

....

33. 2016.03.31 දිනට ව්‍යාපාරයක බැංකු ප්‍රකාශය අනුව බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු 630 000කි. නමුත් එය එදිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සමග අසමාන විය. මෙම වෙනසට හේතු වූයේ පහත දැය.
   (i) ස්ථාවර නියෝග මත ණය වාරික ගෙවීම රු 10 000කි.
   (ii) තැන්පත් කළ නමුත් උපලබ්ධි වී නොමැති චෙක්පත්වල වටිනාකම රු 40 000කි.
      (අ) 2016.03.31 දිනට නිවැරදි කිරීමට පෙර ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය කොපමණ ද?......................
      (ආ) 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වනු ලබන බැංකු ශේෂය කොපමණ ද?..........................

34. පහත වැරදි මගින් ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ වෙනසක් **"ඇති වේද"**, **"ඇති නොවේද"** යන්න දක්වන්න.
   (1) රු 40 000ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් මගහැරීම ....
   (2) රු 15 000ක බැංකු අයිරාව වාසිදායක ශේෂයක් ලෙස ශේෂ පිරික්සුමට උපුටා ගැනීම ....
   (3) රු 4 000ක දුන් වට්ටම් ලද වට්ටම් ගිණුමට හර කිරීම ....
   (4) රු 30 000ක බොල්ණය කපා හැරීම පාලන ගිණුමේ සටහන් කල ද අදාළ ණයගැති ගිණුමේ සටහන් නොවීම. ....

35. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පොදු පරමාර්ථ මූල්‍ය වාර්තාකරණයේ අරමුණ දක්වන්න.

....
....
....
....

36. වෙළෙඳ ව්‍යාපාරයක යෙදෙන සීමිත පොදු සමාගමක පහත එක් එක් අවස්ථාවට වඩාත් ගැලපෙන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

අවස්ථාව	**සංකල්පය**
A - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කිරීම	....
B - සෑම කාලච්ඡේදයක් සඳහා ම ආදායම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම	....
C - වර්ෂය තුළ ගෙවූ කුලී රු 500 000ක් වුවත් ආදායම් ප්‍රකාශනයේ රු 600 000ක් ලෙස වාර්තා කර තිබීම.	....
D - මූල්‍ය කල්බදු ක්‍රමයට ලබාගත් මෝටර් රථයක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමක් ලෙස හඳුනාගෙන තිබීම	....

▲ **ප්‍රශ්න අංක 37 හා 38ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත සඳහන් තොරතුරු ව්‍යාපාරයක වත්කම් දෙකක් සම්බන්ධව වේ.

වත්කම	පිරිවැය රු 000	ඵලදායි ජීව කාලය (වසර)	සුන්බුන් අගය රු 000	2015.04.01 දිනට සමුච්චිත ක්ෂය රු'000
මෝටර් රථය	4 000	10	400	1 800
යන්ත්‍රය	2 000	5	200	720

* 2015.04.01 දින මෝටර්රථ වැඩි දියුණු කිරීම සඳහා රු 600 000ක් වැය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථයේ ඉදිරි ඵලදායි ජීව කාලය වසර 06ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. සුන්බුන් අගය වෙනස් නොවේ.

* 2016.03.31 දින ව්‍යාපාරය පැවති යන්ත්‍රය රු 1 500 000කට විකුණන ලදී.

37. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ වාර්ෂික ක්ෂය වටිනාකම කොපමණ ද?

....

38. යන්ත්‍රය ඉවත් කිරීමේ ලාභය/අලාභය කොපමණ ද?

....

▲ **ප්‍රශ්න අංක 39 හා 40ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

කලණ සහ **නදුන්** 3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ව පහත තොරතුරු සපයා ඇත.

* වාර්ෂිකව රු 100 000 හා 60 000ක වේතනයක් පිළිවෙළින් කලණට හා නදුන්ට හිමි වී ඇත.
* කලණට හා නදුන්ට පිළිවෙළින් රු 60 000ක හා රු 40 000ක අවසාන ලාභ කොටස් බෙදා තිබේ.
* 2016.03.25 දින ඉදිරි ගිණුම් වර්ෂයේ විකුණුම් සඳහා චෙක් පතකින් ලද අත්තිකාරම් මුදල් රු 100 000 නදුන් තම පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් ඇත. මෙම ගනුදෙනුව සම්බන්ධව කිසිදු සටහනක් යොදා නැත.
* කලණ විසින් 2015.04.01 දින ව්‍යාපාරයට රු 400 000ක ණය මුදලක් සපයා තිබූ අතර, ඒ සඳහා ගෙවිය යුතු 10%වාර්ෂික පොලිය සම්බන්ධයෙන් වාර්තා කර නොමැත.

39. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ හවුල් ව්‍යාපාරය උපයා ඇති ශුද්ධ ලාභයේ නිවැරදි වටිනාකම ....

40. ආරම්භක ශේෂයන් නොමැති බවට උපකල්පනය කරමින් 2016.03.31 දිනට කලණ හා නදුන්ගේ ජංගම ගිණුම් ශේෂයන් වන්නේ,

කලණ රු ....

නදුන් රු ....

41. LKAS 37 අනුව **ප්‍රතිපාදන** හා **අසම්භාව්‍ය වගකීම්** අතර වෙනස්කම් දෙකක් දක්වන්න.

ප්‍රතිපාදන	**අසම්භාව්‍ය වගකීම්**
(1)	(1) ....
....	....
(2)	(2) ....
....	....

42. සීමිත පොදු සමාගමක ගිණුම් කාලච්ඡේදය 2016.03.31 දිනෙන් අවසන් වන අතර මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇති දිනය 2016.05.30 වේ. එම දින දෙක අතරතුර සිදු වූ පහත සිදුවීම් "√" ලකුණු යොදමින් **ගලපන සිදුවීම්** සහ **නොගලපන සිදුවීම්** ලෙස වර්ග කර දක්වන්න.

	ගලපන සිදුවීම්	නොගලපන සිදුවීම්
(1) සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ යෝජනා කිරීම.	....	....
(2) වන්දි වෙන් කර ඇති නඩුවක තීන්දුව ලබාදීම.	....	....
(3) ආයෝජනවල මිල පහත යෑම.	....	....
(4) කාලච්ඡේදයේ අවසන් දිනට වූ ණයගැතියෙකු බුන්වත් වීම.	....	....

43. **සීමාසහිත අමාලි පොදු සමාගමේ** 2016.03.31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උධෘතයක් පහත දැක්වේ.

		රු'000
ප්‍රකාශිත ප්‍රාග්ධනය		
සාමාන්‍ය කොටස් (10,000)		300
සංචිත		
පොදු සංචිතය	40	
රඳවාගත් ඉපැයුම්	18	58
මුළු හිමිකම		358

අතිරේක තොරතුරු :

(1) 2016.10.01 දින දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට කොටසක් රු 40ක වටිනාකමකට සංචිත ප්‍රාග්ධනිත කිරීමක් සිදු කරන ලදී.

(2) 2016.10.01 දින කොටසක් රු 20 බැගින් කොටස් 5000ක හිමිකම් නිකුතුවක් සිදු කරන ලදී.

(අ) සංචිත ප්‍රාග්ධනීත කිරීමට අදාළ ද්විත්ව සටහන් දක්වන්න.

....

....

....

(ආ) ඉහත ගනුදෙනුවලින් පසු 2016.10.01 දිනට සමාගමේ මුළු හිමිකම කොපමණ ද?

....

44. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේදී **සීමිත විමුක්ති පොදු සමාගම** රු 20 බැගින් සාමාන්‍ය කොටස් 500 000ක පරිණත ප්‍රසිද්ධ නිකුතුවක් සිදුකරන ලදී. මුළු මුදල ද සමග කොටස් 750 000ක් සඳහා අයදුම්පත් ලැබිණි. කොටස් 500 000ක් සමානුපාතිකව විභජනය කරන ලද අතර අතිරික්ත මුදල් අයදුම්කරුවන් වෙත ආපසු යවන ලදී.

පහත ඇ සඳහා ජර්නල් සටහන් ලියා දක්වන්න. (සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)

(අ) අතිරික්ත අයදුම්පත්වල මුදල් ආපසු යැවීම.

....

....

(ආ) කොටස් විභජනය කිරීම.

....

....

45. පහත තොරතුරු සමාගම් දෙකකට අදාළ වේ.

	සසිඳු සමාගම	**කවිඳු සමාගම**
ණය හිමිකම් අනුපාතය	2 : 1	1 : 2
තොග පිරිවැටුම් අනුපාතය	වාර 6	වාර 10
පොලී ආවරණ අනුපාතය	වාර 5	වාර 10
මුළු වත්කම්වලට ප්‍රතිලාභ අනුපාතය	35%	10%
ක්ෂණික අනුපාතය	1 : 1	0 . 5 : 1

	සමාගම
(අ) ද්‍රවශීලතාවය අනුව වඩා හොඳ සමාගම	....
(ආ) වත්කම් කාර්යක්ෂම ලෙස යොදවා ඇති සමාගම	....
(ඉ) දිගුකාලීන ණයහිමියන්ගේ සුරක්ෂිත බව වඩා වැඩි සමාගම	....
(ඊ) අව තෝලනයක් ඇති සමාගම	....

46. **තොග පාලනයේදී** පහත සඳහන් කාර්යයන් සඳහා භාවිත වන ලේඛන සඳහන් කරන්න.

(i) ද්‍රව්‍ය මිල දී ගන්නා ලෙස ගබඩාවෙන් මිල දී ගැනුම් අංශය වෙත ඉල්ලීමක් කිරීම ....

(ii) නිෂ්පාදන දෙපාර්තමේන්තුවකට අවශ්‍ය ද්‍රව්‍ය ව්‍යාපාරයේ ගබඩාවෙන් ඉල්ලුම් කිරීම ....

(iii) මිල දී ගැනුම් අංශය විසින් බාහිර සැපයුම්කරුවෙකුගෙන් ද්‍රව්‍ය ඉල්ලා සිටිනු ලැබීම ....

(iv) සැපයුම්කරුවෙකුගෙන් ගබඩාවට ද්‍රව්‍ය ලද බවට සහතික වීම ....

47. **සුන්දරම්ගේ** පොල්තෙල් නිෂ්පාදන ව්‍යාපාරයේ **"කොප්පරා"** සම්බන්ධව පහත දත්තයන් අදාළ වේ.

උපරිම ඇනවුම් කාලය	දින	6
අවම ඇනවුම් කාලය	දින	2
අවම භාවිතය දිනකට		60 kg
යළි ඇනවුම් ප්‍රමාණය	ඒකක	500
උපරිම තොග මට්ටම	ඒකක	980

දිනකට උපරිම භාවිතය කොපමණ ද? ....

The National e-learning Portal for The General Education

48. ආයතනයක ශ්‍රම පිරිවැය පාලනය සම්බන්ධයෙන් යොදා ගන්නා පහත සඳහන් වාර්තා **"රැඳී සිටීමේ කාලය"** හෝ **"ක්‍රියාකාරී කාලය"** වාර්තා කිරීම සඳහා ද යන්න **"√"** ලකුණකින් දක්වන්න.

වාර්තාව	**රැඳී සිටීමේ කාලය**	**ක්‍රියාකාරී කාලය**
(i) දෛනික කාල පත්‍රය	....	....
(ii) ඇඟිලි සලකුණු යන්ත්‍රය	....	....
(iii) අත්සන් ලේඛණය	....	....
(iv) කාර්ය තුණ්ඩුව	....	....

49. නිෂ්පාදන ආයතනයක පොදු කාර්ය පිරිවැයට අදාළ ව පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

සත්‍ය/අසත්‍ය

A - **ප්‍රතිපාදනය** යනු යම් පිරිවැය මධ්‍යස්ථානයකට අදාළ ව ඍජුව හඳුනාගත හැකි පොදු කාර්ය පිරිවැය එයට ඇතුළත් කිරීමයි ....

B - ගබඩා පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථානවලට නැවත විභජනය කිරීමේ පදනමක් ලෙස **"භූමියේ වර්ග ඵලය"** යොදා ගත හැකිය. ....

C - ඇස්තමේන්තු ගත මුළු පොදු කාර්ය පිරිවැය සත්‍ය ඒකක ගණනින් බෙදීමෙන් **පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතයක්** ගණනය කළ හැකිය. ....

D - සේවා පිරිවැය මධ්‍යස්ථානවල රැස්කරන ලද පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන අතර බෙදා හැරීම **"නැවත විභජනය"** ලෙස හඳුන්වයි. ....

50. "ටෙනිස් බෝල" නිපදවන ව්‍යාපාරයක පිරිවැය දත්ත පහත දී ඇත.

ඒකකයක විචල්‍ය පිරිවැය (රු)	60
ස්ථාවර පිරිවැය (රු)	100 000
දායක විකුණුම් අනුපාතය	40%

අපේක්ෂිත විකුණුම් ඒකක 5000 දී පහත දෑ ගණනය කොට දක්වන්න.

(අ) ආරක්ෂිත ආන්තිකයේ ටෙනිස් බෝල සංඛ්‍යාව ....

(ආ) අපේක්ෂිත විකුණුම් මට්ටම ඒකක 5000 දී අපේක්ෂිත ලාභය රු ....

* * *

අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2016

33 - ගිණුම්කරණය II

පැය තුනයි

සැලකිය යුතුයි :

- ★ පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.
- ★ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අළුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- ★ අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න.

1. සීමිත විස්කම් පොදු සමාගමේ 2016.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත.

	හර(රු'000)	බැර(රු'000)
දේපල, පිරියත හා උපකරණ පිරිවැය/ප්‍රත්‍යාගණන අගය	15 000	
2015.04.01 දිනට තොගය	1 800	
ගැනුම්	8 500	
වෙළෙඳ ලැබිය යුතු දෑ	3 500	
ගොඩනැගිලි කුලී	720	
10% ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත්	1 200	
සේවක වැටුප්	810	
කල්බදු පොලී	465	
වරිපනම් හා රක්ෂණ	60	
මෝටර් රථ ඉන්ධන හා නඩත්තු වියදම්	80	
විදුලිය හා දුරකථන ගාස්තු	320	
විකුණුම් කොමිස්	52	
බැංකු මුදල් ශේෂය	512	
විකුණුම්		15 700
2015.04.01 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය		10 000
පොදු සංචිතය		1 500
2015.04.01 දිනට රඳවාගත් ඉපැයුම්		944
කල්බදු ණයහිමියෝ		1 200
වෙළෙඳ ගෙවිය යුතු දෑ		1 535
2015.04.01 දිනට දේපල පිරියත උපකරණ සමුච්චිත ක්ෂය		1 740
2015.04.01 දිනට අඩමාණ ණය වෙන් කිරීම		400
	33 019	33 019

අතිරේක තොරතුරු :

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැලපීම් කළයුතු වේ.

(i) 2016.03.31 දිනට තොගයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය පිළිවෙළින් රු 1 500 000ක් හා රු 1 600 000ක් විය. කෙසේ වුවද 2016.05.01 දින සම්පූර්ණ තොගය 1 450 000කට විකුණන ලදී. 2016.05.30 දින අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

(ii) දේපල, පිරියත හා උපකරණවල සංයුතිය හා අනෙකුත් තොරතුරු පහත දැක්වේ.

වත්කම	**පිරිවැය/සාධාරණ අගය**	**සමුච්චිත ක්ෂය**
	2016.03.31 දිනට	2015.04.01 දිනට
	(රු 000)	(රු 000)
ඉඩම්	8 000	-
පරිපාලන ගොඩනැගිල්ල (ප්‍රත්‍යාගණනයට පෙර)	5 000	1 500
බෙදා හැරීමේ රථ	1 200	-
ලීබඩු හා කාර්යාල උපකරණ	800	240
	15 000	1 740

- පරිපාලන ගොඩනැගිල්ල සහ ලීබඩු හා කාර්යාල උපකරණ පිරිවැය මත 10% බැගින් සරළ මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iii) ඉඩම 2013 වර්ෂයේ රු 8 500 000කට මිලදී ගෙන ඇති අතර 2014 වර්ෂයේ වෘත්තීය තක්සේරුකරුවකු විසින් ප්‍රථම වරට රු 8 000 000කට ප්‍රත්‍යාගණනය කර ඇත. 2016.03.31 දින ඉඩම නැවත රු 10 000 000කට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(iv) පරිපාලන ගොඩනැගිල්ල ප්‍රථම වරට 2016.03.31 දින රු 3 400 000කට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(v) දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති බෙදා හැරීමේ රථය 2015.04.01 දින මූල්‍ය කල්බදු ක්‍රමයට අත්පත් කර ගන්නා ලද්දකි. කල්බදු කාලය වසර 4ක් වන අතර එහි ඵලදායි ජීවකාලය වසර 5කි. කල්බදු කාලය අවසානයේ දී වත්කමේ අයිතිය ගැනුම්කරුට හිමි **නොවේ**. මේ සඳහා මූලික ගෙවීමක් නොමැති අතර ගෙවන ලද වාර්ෂික කල්බදු වාරිකය කල්බදු පොලී ගිණුමට හර කර ඇත. වර්ෂ 4 සඳහා කල්බදු පොලිය පහත පරිදි වේ.

වර්ෂය	**පොලිය (රු 000)**
2015/16	240
2016/17	195
2017/18	145
2018/19	80

(vi) භාණ්ඩාගාර බිල්පත් මිල දී ගෙන ඇත්තේ 2016.01.01 දින වේ.

(vii) ගොඩනැගිලි කුලී ලෙස දක්වා ඇත්තේ ප්‍රදර්ශනාගාරය හා ගබඩාව පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා වර්ෂයකට අදාළ කුලිය වේ. එය කුලියට ගෙන ඇත්තේ 2015.10.01 දින දීය. තවද 2016.03.31 දිනෙන් අවසන් කාර්තුවේ වරිපනම් හා රක්ෂණ ගාස්තු රු 80 000ක් උපචිත ව ඇත.

(viii) සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවක හා සේව්‍ය දායකයන් පිළිවෙළින් 10%ක් හා 15%ක් වේ. සේවක භාරකාර අරමුදල් (ETF) දායකය 3%කි. EPF හා ETF සම්බන්ධව කිසිදු ගෙවීමක් හෝ වෙන් කිරීමක් සිදුකර නැත. සේවක වැටුප් ලෙස දක්වා ඇත්තේ EPF සේවක දායකය අඩුකර ගත් පසු වටිනාකමය.

(ix) වර්ෂයට අදාළ භාණ්ඩාගාර බිල්පත් පොලිය උපචිතව ඇත.

(x) වසර අග වෙළෙඳ ලැබිය යුතු දැ ශේෂයෙන් රු 80 000ක් බොල්ණය ලෙස කපා හැරීමටත් ඉතිරි වෙළෙඳ ලැබිය යුතු දැ ශේෂය මත 10%ක් අඩමාණ ණය සඳහා වෙන් කිරීමටත් තීරණය කරන ලදී.

(xi) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බද්ද බදු පෙර ලාභයෙන් 1/3 ලෙස ඇස්තමේන්තු කර ඇත. ඒ සඳහා කිසිදු වෙන් කිරීමක් හෝ ගෙවීමක් සිදුකර නැත.

(xii) 2016.03.31 දින අධ්‍යක්ෂවරුන් පහත තීරණ ගන්නා ලදී.

- රඳවාගත් ඉපයුම්වලින් රු 500 000ක් පොදු සංචිතයට මාරුකිරීම.
- රු 600 000ක ලාභාංශයක් ගෙවීම.

අවශ්‍ය වන්නේ:

LKAS-1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා **සීමිත විහඟ පොදු සමාගමේ** පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

1. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.
2. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය.
3. 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු 20යි)

2. (අ) **ඕලු නෙලුම්** සහ **මානෙල්** 2 : 2 : 1 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. 2015.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත පරිදි වේ.

	(රු 000)	(රු 000)
ජංගම නොවන වත්කම්		
දේපල පිරියත හා උපකරණ	3 800	
සමුච්චිත ක්ෂය	(820)	2 980
ජංගම වත්කම්		
තොගය	250	
වෙළෙඳ ණයගැතියෝ	750	
අඩමාන ණය වෙන්කිරීම්	(150)	
මුදල්	480	1 330
		4 310
ප්‍රාග්ධන ගිණුම්		
ඕලු	900	
නෙලුම්	700	
මානෙල්	800	2 400
ජංගම ගිණුම්		
ඕලු	460	
නෙලුම්	400	
මානෙල්	540	1 400
ජංගම වගකීම්		
වෙළෙඳ ණයහිමියෝ	400	
උපචිත කාර්යාල වියදම්	110	510
		4 310

අතිරේක තොරතුරු :

01. 2015.04.01 දින **මානෙල්** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙදිනට කීර්තිනාමය රු 800 000කට එකඟ වූ අතර මේ සම්බන්ධයෙන් සියලු ගැලපීම් ප්‍රාග්ධන ගිණුම් තුළින් සිදුකළ යුතුය. මානෙල්ට ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කිරීමටත් එයට වාර්ෂිකව 5%ක් පොලියක් ගෙවීමටත් එකඟ විය.
02. ඕලු සහ නෙලුම් හවුල් ව්‍යාපාරය පහත එකඟතා යටතේ දිගටම කරගෙන යාමට අනෙක් හවුල්කරුවන් එකඟ වූහ.
    (අ) සෑම හවුල්කරුවෙකුටම රු 120 000ක වාර්ෂික වේතනයක් ගෙවීම.
    (ආ) ගලපන ලද ප්‍රාග්ධන ශේෂය මත 10% වාර්ෂික පොලියක් හිමිවීම.
    (ඉ) ලාභාලාභ සමානව බෙදා ගැනීම.
03. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මුදල් ගනුදෙනුවල සාරාංශය පහත දැක්වේ.

ලැබීම්	**රු'000**
ණයගැති ලැබීම්	5 250
ගෙවීම්	
සේවක වැටුප්	400
ණය හිමියන්ට ගෙවීම්	3 100
කාර්යාල වියදම්	600
බෙදා හැරීමේ වියදම් (2015.04.01 සිට මාස 15ක් සඳහා)	900
ගැනිලි - ඕලු	240
- නෙලුම්	260
මානෙල්ට ගෙවූ ණය පොලිය	75

04. සියලුම දේපල පිරියත සහ උපකරණ පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

05. 2016.03.31 දිනට මුදල් හැර ජංගම වත්කම් හා වගකීම්

	රු '000
තොගය	700
ණයගැතියෝ	500
උපචිත කාර්යාල වියදම්	150
ණයහිමියෝ	100

06. වර්ෂය අවසානයේ ණයගැති ශේෂය මත වාර්ෂිකව 20%ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කිරීම හවුල් ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ.

07. සියලු ම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදුවේ.

අවශ්‍ය වන්නේ :

1. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (විසර්ජනයන්ද ඇතුලුව)
2. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්
3. 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(ලකුණු 10)**

(ආ) **ලාලිත්‍යා ව්‍යාපාරය** නිෂ්පාදනය කරන විශේෂ වර්ගයක මල් පෝච්චි සඳහා එක්තරා කාල පරිච්ඡේදයකදී පොදු කාර්ය පිරිවැය ප්‍රාථමික විභජනය කර ඇති ආකාරය පහත දැක්වේ.

නිෂ්පාදන දෙපාර්තමේන්තු		සේවා අංශ	
නිමැවුම් (රු)	පින්තාරු (රු)	ගබඩාව (රු)	නඩත්තු අංශය (රු)
505 000	600 000	105 000	70 000

අතිරේක තොරතුරු

(1)

	නිමැවුම්	පින්තාරු	ගබඩාව	නඩත්තු අංශය
ඇස්තමේන්තු ගත මුළු යන්ත්‍ර පැය	3000	2000	-	-
නඩත්තු පැය ගණන	5000	3000	-	-
ගබඩා අධියාචනා පත් ගණන	20	30	-	-
සේවක සංඛ්‍යාව	25	15	5	5
ඒකකයක් නිපදවීම සඳහා ගතවන යන්ත්‍ර පැය ගණන	1	1/2	-	-

(2) ප්‍රාථමික විභජනයේ දී පහත අයිතමයන් මග හැරී ඇති බව පසුව සොයා ගෙන ඇත.

	රු
සේවක සුභසාධක වියදම්	100 000
සුපරීක්ෂක වේතන - නිමැවුම්	120 000
පින්තාරු	139 000

(3) ඒකකයක සෘජු ද්‍රව්‍ය පිරිවැය රු 400ක්ද සෘජු ශ්‍රම පිරිවැය රු 200ක් ද වන අතර වෙනත් සෘජු වියදම් නොමැත.

අවශ්‍ය වන්නේ :

1. පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව
2. එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහනය කරනු ලබන්නේ **යන්ත්‍ර පැය පදනම** මත ලෙස සලකා ඒකකයක මුළු පිරිවැය ගණනය කිරීම.
3. පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ **ප්‍රාථමික පිරිවැයෙන් 75%ක්** ලෙස සලකා ඒකකයක මුළු පිරිවැය ගණනය කිරීම.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

3. (අ) **මියුරු** ආයතනයේ 2016/01/01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්‍ෘතයක් පහත දැක්වේ.

	රු'000
ඉඩම	1 400
මෝටර් රථ	1 000
ලී බඩු සහ සවිකිරීම්	500
තොගය	165
වෙළෙඳ ලැබිය යුතු දෑ	135
මුදල් ශේෂය	550
12% බැංකු ණය	100
වෙළඳ ගෙවිය යුතු දෑ	450

පහත සඳහන් ගනුදෙනු ජනවාරි මාසය තුළ සිදු වී ඇත.

1. රු 65 000 වටිනා භාණ්ඩ තොගයක් මිල දී ගන්නා ලදී.
2. රු 80 000ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු 115 000කට විකුණන ලද අතර ඉන් රු 75 000ක් මුදලින් ලද අතර ඉතිරිය ණයට වේ.
3. ජනවාරි මාසයේ ගොඩනැගිලි කුලී ගෙවීම රු 20 000කි.
4. රු 100 000ක් වටිනා ණය ගැතියන්ගෙන් මුදල් ලද අතර අඩුකල වට්ටම 5%කි.
5. **මියුරු** තම නිවසේ විදුලි බිල වූ රු 5 000ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවන ලදී.
6. බැංකු ණය රු 6 000 ගෙවූ අතර එහි ඇතුළත් ණය පොලිය රු 1 000කි.

අවශ්‍ය වන්නේ

1. 2016/01/31 දිනෙන් අවසන් මාසය සඳහා ඉහත ගනුදෙනු හේතුවෙන් ව්‍යාපාරයට සිදුවන බලපෑම පහත සඳහන් ඇති ගිණුම්කරණ සමීකරණයට ආදේශ කිරීම.

ගනුදෙනු අංකය සහ ශේෂ	වත්කම්				වගකීම්		හිමිකම්
	දේපල පිරියත හා උපකරණ	වෙළෙඳ ලැබිය යුතු දෑ	තොගය	මුදල්	වෙළෙඳ ගෙවිය යුතු දෑ	බැංකු ණය	
ඉ/ගෙ ශේෂය							

2. ශුද්ධ වත්කම් ඇසුරෙන් ජනවාරි මාසයේ ලාභය ගණනය කිරීම.

(ලකුණු 05 යි)

(ආ) පහත දැක්වෙන තොරතුරු 2016 මාර්තු මාසය සඳහා **සීමිත ෂෙරින් පොදු සමාගමේ** සේවක වැටුප් සම්බන්ධව වේ.

(i) සේවකයින්ගේ මූලික වැටුප මත සේවක අර්ථ සාධක අරමුදල (EPF) සඳහා සේවක හා සේවා යෝජක දායකත්වයන් පිළිවෙළින් රු 10% හා 15%කි. සේවක භාරකාර අරමුදල සඳහා සේවා යෝජක දායකත්වය 3%කි.

(ii) මාර්තු මාසය තුළ ණය වාරික රු 80 000ක් ද, උත්සව අත්තිකාරම් රු 500 000ක් ද වැටුප් අත්තිකාරම් රු 300 000ක් ද සේවක වැටුපෙන් අඩු කරගෙන ඇත.

(iii) සේවකයින්ගේ වැටුප් වේතන හා අනෙකුත් ගෙවීම් ඊළඟ මාසයේ 10 වන දින සිදුකරනු ලැබේ.

(iv) වැටුප් හා වේතනවල සංයුතිය පහත පරිදි වේ.

රු'000

ඉපයීම් අයිතමය	එකතුව	නිෂ්පාදන සේවක	නිෂ්පාදන සුපරීක්ෂක	නිෂ්පාදන නොවන අනෙකුත් සේවා
මූලික වැටුප	2 800	1 500	300	1 000
දිරි දීමනා	300	250	50	-
සමාගමේ ලාභ පදනම්ව ප්‍රසාද දීමනා	470	150	20	300
ගමන් වියදම් දීමනා	260	100	10	150
අතිකාල දීමනා	50	50	-	-
දළ වැටුප	3 880	2 050	380	1 450

අවශ්‍ය වන්නේ :

1. ඉහත තොරතුරු පදනම් කරගෙන එක් එක් අයිතමයේ මුළු වටිනාකම දක්වමින් වැටුප් ලේඛනයක්.
2. සේවකයින්ට අදාළ **ඍජු වේතන**, **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයට අදාළ වේතන** හා **මුළු ශ්‍රම පිරිවැය** වෙන වෙන ම

(ලකුණු 05 යි)
(මුළු ලකුණු 15යි)

4. **(අ) සිරිල්ගේ** සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2016 මාර්තු මාසයේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- මාර්තු 01 දිනට ණයහිමි ලෙජරයේ ශේෂයන්

	රු
අමිත්	20 000
චරිත්	30 000
ජනිත්	24 000
සුමිත්	16 000
	90 000

- මාර්තු මාසය සඳහා පිළියෙල කළ මූලික පොත් සාරාංශයන්

ගැනුම් ජර්නලය

සැපයුම් කරු	වටිනාකම (රු)
අමිත්	75 000
චරිත්	60 000
ජනිත්	37 500
	172 500

ආපසු යැවුම් ජර්නලය

සැපයුම් කරු	වටිනාකම (රු)
අමිත්	5 000
	5 000

මුදල් ගෙවීම් ජර්නලය

විස්තරය	මුදල (රු)	ගැනුම් (රු)	ණයහිමියෝ (රු)	විවිධ ගෙවීම් (රු)
ගැනුම්	40 000	40 000		
අමිත්	20 000		20 000	
චරිත්	10 000		10 000	
ගැනුම්	30 000	30 000		
ගෙවූ ගොඩනැගිලි කුලී	25 000			25 000
සුමිත්	10 000		10 000	
ජනිත්	30 000		30 000	
අමිත්	15 000		15 000	
ගෙවූ පොලී	8 000			8 000
ලලිත්	20 000		20 000	
	208 000	70 000	105 000	33 000

- ලලිත්ගෙන් ණයට ගත් පරිගණකයක් සඳහා ගෙවූ රු 20 000ක් ණයහිමියන්ට ගෙවීම් ලෙස දක්වා ඇත.

අවශ්‍ය වන්නේ :

2016 මාර්තු මාසය සඳහා

1. ණයහිමි ලෙජරය හා ණයහිමි ශේෂ ලැයිස්තුව
2. පොදු ලෙජරයෙහි ණයහිමි පාලන ගිණුම (අදාළ නිවැරදි කිරීම් සමඟ) සහ ගැනුම් ගිණුම

(ලකුණු 10 යි)

(ආ) 2015.04.01 දිනට **සඳුන්ගේ** ව්‍යාපාරයේ දේපල පිරියත හා උපකරණ පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම් පහත දැක්වේ.

	පිරිවැය (රු 000)	**සමුච්චිත ක්ෂය (රු 000)**
ගොඩනැගිල්ල	6 500	3 250
මෝටර් රථය	4 800	2 200
යන්ත්‍රය	3 000	1 500
ලී බඩු සහ සවිකිරීම්	1 000	400

* 2015.04.01 දින රු 1 250 000 පිරිවැයක් දරා ගොඩනැගිලි නවීකරණය කර ඇත. ඒ හේතුවෙන් එහි මුළු ඵලදායි ජීවකාලය වසර 20 සිට 25 දක්වා වැඩි වී ඇත. සුන්බුන් අගයක් නොමැත.
* ව්‍යාපාරය සතු මෝටර් රථය 2015.04.01 දින රු 3 800 000ක් ලෙස ප්‍රත්‍යාගණනය කර ඇත.
* 2015.04.01 දින ව්‍යාපාරය සතුව පැවති පැරණි යන්ත්‍රය රු 1 000 000 විකුණා ඇත.
* ලී බඩු සහ සවිකිරීම් හා කාර්යාල උපකරණ සඳහා සුන්බුන් අගයන් පිළිවෙළින් රු 200 000 හා රු 50 000 වූ අතර ඒවායේ ඇස්තමේන්තු ගත ඵලදායි ජීව කාලයන් පිළිවෙළින් වසර 20 හා වසර 9ක් වේ.
* 2015.10.01 දින රු 500 000ක කාර්යාල උපකරණ මිල දී ගෙන ඇත.

අවශ්‍ය වන්නේ :

1. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගොඩනැගිලි, ලී බඩු සහ සවිකිරීම් සහ කාර්යාල උපකරණ වාර්ෂික ක්ෂය
2. මෝටර් රථ ප්‍රත්‍යාගණන ලාභය/අලාභය
3. යන්ත්‍ර ඉවත් කිරීමේ ගිණුම

(ලකුණු 05 යි)
(මුළු ලකුණු 15යි)

5. **(අ) සීමිත සූර්ය පොදු සමාගමේ** 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පහත පරිදි වේ.

ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	රු'000
විකුණුම්	8 500
විකුණුම් පිරිවැය	(5 300)
දළ ලාභය	3 200
වෙනත් ආදායම්	100
	3 300
බෙදා හැරීමේ වියදම්	(2 300)
පරිපාලන වියදම්	(550)
මූල්‍ය වියදම්	(70)
බදු පෙර ලාභය	380
ආදායම් බදු	(220)
කාලච්ඡේදයේ ලාභය	160

2015.03.31 දිනට හා 2016.03.31 දිනට උපුටා ගනු ලැබූ සංක්ෂිප්ත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි වේ.

	2016.03.31	2015.03.31
	රු'000	රු'000
දේපල පිරියත හා උපකරණ (ධාරණ අගය)	3 800	4 000
තොගය	600	350
ණයගැතියෝ	430	540
ඉදිරියට ගෙවූ මෙහෙයුම් වියදම්	30	65
ත්‍රෛයිමාසික භාණ්ඩාගාර බිල්පත්	80	100
බැංකු	20	–
මුදල්	70	85
	5030	5140
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්	3 600	3 300
රඳවාගත් ඉපැයුම්	250	150
බැංකු ණය	700	900
ණය හිමියෝ	150	180
ගෙවිය යුතු ආදායම් බදු	110	80
උපචිත මෙහෙයුම් වියදම්	220	150
බැංකු අයිරාව	-	380
	5030	5140

අතිරේක තොරතුරු

1. 2016.03.31 දින එදිනට ධාරණ අගය රු 800 000ක් වූ යන්ත්‍රයක් විකුණන ලද අතර එයින් ලද ලාභය ආදායම් ප්‍රකාශනයේ වෙනත් අදායම් ලෙස ඇතුළත් කර ඇත.
2. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වීම් රු 280 000 කි.
3. වර්ෂය තුළ දී සමාගම විසින් කොටස් හිමියන්ට අතුරු ලාභාංශ ගෙවා ඇත.
4. මුළු විකුණුම්වලින් 60% ක් අත්පිට විකුණුම් වන අතර සියලු ගැනුම් ණය පදනම මත සිදු වී ඇත.
5. වර්ෂය තුළ දී බැංකු ණය වාරිකය රු 470 000ක් ගෙවූ අතර එයින් රු 70 000ක් ණය පොලිය වේ. මූල්‍ය වියදම තුළ නියෝජනය වන්නේ මෙම ණය පොලියයි.

අවශ්‍ය වන්නේ :

1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS-07)ට අනුව **සෘජු ක්‍රමය භාවිතා කර** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **(ලකුණු 10 යි)**

(ආ) චිරත්මා කේවල ස්වාමී ව්‍යාපාරයක හිමිකාරියකි. පහත දැක්වෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එම ව්‍යාපාරයෙහි ගිණුම් සහයකයෙකු විසින් පිළියෙල කර ඇත.

2015/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	රු	රු
දේපල පිරියත හා උපකරණ		600 000
තොග	240 000	
ණයගැතියෝ	110 000	
බැංකුවේ හා අත ඉතිරි මුදල්	280 000	
අවිනිශ්චිත ගිණුම	100 000	
		730 000
		1 330 000
ප්‍රාග්ධනය	800 000	
ශුද්ධ ලාභය	300 000	
		1 100 000
ණයහිමියෝ		230 000
		1 330 000

The National e-learning Portal for General Education

පහත සඳහන් වැරදි පසුව අනාවරණය වී ඇත.

1. රු 3 500ක දුන්වට්ටම් ලෙජර ගිණුම්වල සටහන් කර ඇත්තේ රු 5 300 ලෙසය.
2. රු 20 000ක අත්පිට විකුණුම්, විකුණුම් ගිණුමට දෙවරක් බැර කර ඇත.
3. ණය හිමියන්ට ගෙවීම් රු 65 000ක් හා වැටුප් රු 15 000ක් මුදල් ගෙවීම් ජර්නලයේ සහ මුදල් පාලන ගිණුමේ නිවැරදි ව සටහන් කර තිබූ නමුත් අදාළ අනෙකුත් ගිණුම්වලට පිටපත් කර නොමැත.

අවශ්‍ය වන්නේ,

1. ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් සහ ශුද්ධ ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනයක්
2. වැරදි නිවැරදි කළ පසු 2015/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු 05 යි)

(මුළු ලකුණු 15 යි)

6. (අ) **පාසලක** වාණිජ දිනය පැවැත්වීම සඳහා අරමුදල් සපයා ගැනීමට වාණිජ ශිෂ්‍ය සංගමය විසින් ශිෂ්‍ය ගායක ගායිකාවන් යොදවා සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට සැලසුම් කරමින් සිටී. මෙයට අදාළව අපේක්ෂිත ආදායම් හා පිරිවැය තොරතුරු පහත පරිදි වේ.

	රු
ප්‍රවේශ පත්‍රයක මිල	100
එක් ශිෂ්‍යයෙකු සඳහා සුළු ආහාරයක් සහ වෙනත් වියදම්	30
ටිකට් පත් මුද්‍රණ වියදම	2 000
ලිපිද්‍රව්‍ය වියදම	1 000
ශ්‍රවනාගාර කුලී	10 000
ප්‍රචාරණ වියදම	2 000
ශබ්ද විකාශන උපකරණ සඳහා වියදම	20 000

අවශ්‍ය වන්නේ

1. ලාභයක් හෝ අලාභයක් නොලබන මට්ටම සඳහා විකිණිය යුතු ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව
2. රු 35 000ක ලාභයක් ලැබීම සඳහා විකිණිය යුතු ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව
3. ප්‍රවේශ පත්‍ර 750ක් විකුණන විට ලාභය
4. ප්‍රවේශ පත්‍ර 800ක් විකුණන විට රු 37 000ක ලාභයක් ලබාගැනීම සඳහා ප්‍රවේශ පත්‍රයක විකුණුම් මිල ලෙස නියම කළ යුතු වටිනාකම

(ලකුණු 05 යි)

(ආ) **ලහිරු** විසින් පවත්වාගෙන යන තනි පුද්ගල ව්‍යාපාරයේ **සුළු මුදල් වියදම් හැර** අනෙකුත් සියලුම ගෙවීම් බැංකු ගිණුම මගින් (චෙක්පත්වලින්) සිදු කරන අතර සියලුම මුදල් ලැබීම් සෘජුවම බැංකු ගිණුමට හෝ චෙක්පත් මගිනි. බැංකු ගනුදෙනු සම්බන්ධ අනෙකුත් තොරතුරු පහත දැක්වේ.

(1) 2016 මාර්තු මාසයේ සිදු වූ ගනුදෙනු

ලැබීම්	(රු 000)	**ගෙවීම්**	(රු 000)
අත්පිට විකුණුම්	560	ගැනුම්	220
ව්‍යාපාරයේ ප්‍රයෝජනයට තිබූ කාර්යාල උපකරණ විකුණුම්	200	ණය හිමියන්ට - සනත්	300
ණයගැති ලැබීම් - අමල්	320	වියදම් සඳහා	240
අත්පිට විකුණුම්	60	ණයහිමියන්ට - රවී	40
ණයගැති ලැබීම් - කමල්	150	ගැණුම්	200

(2) 2016 මාර්තු මාසය සඳහා ලැබුණු බැංකු ප්‍රකාශනයේ සාරාංශය

	(රු 000)
උපලබ්ධි වූ චෙක්පත්	1 000
නිකුත් කළ චෙක්පත් සඳහා ගෙවීම්	700
ණයගැති සෘජු ප්‍රේෂණ	100
බැංකුව අයකල ගාස්තු	20
ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරික	15
තැන්පත් කළ අගරු චෙක්පත්	90

(3) 2016.03.01 දින ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු 10 000ක් වූ අතර එය එදින බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකග විය.

(4) ණයගැතියන්ට දුන් වට්ටම් රු 4 000 ක් වූ අතර ණය හිමියන්ගෙන් ලද වට්ටම් රු 3 000ක් විය.

අවශ්‍ය වන්නේ

(1) ඉහත අංක (1)හි තොරතුරු ඇසුරෙන් 2016 මාර්තු මාසය සඳහා බැංකු ගිණුම ආශ්‍රිතව ලැබීම් හා ගෙවීම් ජර්නල වෙන් වෙන් ව දැක්වීම.

(2) 2016.3.31 දිනට බැංකු ගිණුම සංශෝධනය කර බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම.

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

7. **(අ)** සමාගමක් විසින් පරිහරණය කරන යන්ත්‍රය විකුණා නව අධිතාක්ෂණික යන්ත්‍රයක් මිල දී ගැනීමට අපේක්ෂා කරයි. නව යන්ත්‍රයෙහි ඇස්තමේන්තු ගත පිරිවැය පහත පරිදි වේ.

	රු '000'
ගැනුම් මිල	2 500
සවිකිරීමේ පිරිවැය	200
වැඩ බිම සකස් කිරීමේ පිරිවැය	300
යන්ත්‍ර ප්‍රවාහනය කිරීමේ පිරිවැය	100

පහත තොරතුරු සපයා ඇත.

1. පැරණි යන්ත්‍රය විකිණිය හැකි මිල රු 600 000කි. පැරණි යන්ත්‍රයේ ධාරණ අගය රු 500 000ක් වේ.
2. නව යන්ත්‍රය මිල දී ගැනීම නිසා පවතින කාරක ප්‍රාග්ධනය රු 100 000 සිට 250 000 දක්වා වැඩි වනු ඇත. එම වැඩිවන වටිනාකම හතර වන වර්ෂයේ දී උපලබ්ධි වේ.
3. නව යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායි ජීව කාලය හා පැරණි යන්ත්‍රයේ මින් ඉදිරියට අපේක්ෂිත ඵලදායි ජීව කාලය වර්ෂ 4කි. නව යන්ත්‍රයේ අපේක්ෂිත සුන්බුන් අගය රු 200 000ක් වන අතර පැරණි යන්ත්‍රයේ සුන්බුන් අගයක් නොමැත.
4. ඉදිරි වර්ෂ හතර සඳහා ඇස්තමේන්තු ගත වාර්ෂික **මෙහෙයුම්** මුදල් ප්‍රවාහයන් පහත දැක්වේ.

වර්ෂය	මුදල් ලැබීම රු '000		මුදල් ගෙවීම් රු '000	
	පැරණි යන්ත්‍රය	නව යන්ත්‍රය	පැරණි යන්ත්‍රය	නව යන්ත්‍රය
1	800	1 800	400	600
2	900	2 300	500	800
3	900	2 400	600	1 100
4	800	2 200	550	1 300

5. 10% අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත (වට්ටම් සාධක) පහත දැක්වේ.

වර්ෂය	1	2	3	4
වට්ටම් සාධක	0.9	0.8	0.7	0.6

අවශ්‍ය වන්නේ

1. ව්‍යාපෘතියේ ආරම්භක ශුද්ධ මුදල් ප්‍රවාහය (අයිතමයන් වෙන් වෙන්ව දක්වමින්)
2. පළමු වර්ෂයේ සිට වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහයන්
3. නව යන්ත්‍රයේ ශුද්ධ වර්තමාන අගය **(ලකුණු 05 යි)**

(ආ) මහේෂිකා කාන්තා සංගමය සාමාජිකාවන් සඳහා ස්වයං රැකියා ණය සපයන අතර හදිසි ආපදා අවස්ථාවන්හිදී මුදල් ආධාර ද සපයනු ලැබේ.

මෙහි අරමුදල් තර කර ගැනීම සඳහා සාමාජික මුදල්වලට අමතරව සාමාජිකාවන්ගේ ශ්‍රම දායකත්වයෙන් රෙදි අත්බෑග් නිෂ්පාදන ව්‍යාපාරයක් ද පවත්වා ගෙන යයි. මේ සඳහා ශ්‍රමය සපයන සාමාජිකාවන්ට සාධාරණ වැටුපක් ද ගෙවනු ලැබේ.

ඉහත සංගමයේ තොරතුරුවලින් තෝරාගත් තොරතුරු අයිතම කිහිපයක් පහත පරිදි වේ.

1. **මුදල් ලැබීම්**

	රු
සාමාජික මුදල්	300 000
ණය පොලී ලැබීම්	80 000
සාමාන්‍ය පරිත්‍යාග	200 000

2. **මුදල් ගෙවීම්**

	රු
අමුද්‍රව්‍ය මිලට ගැනීම්	350 000
මැහුම් හලේ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	113 100
පරිපාලන වියදම්	300 000
බෑග් විකිණීමේ වියදම්	50 000
හදිසි ආපදා ආධාර	250 000

3. **වත්කම් හා වගකීම්**

	2016.03.31 (රු)	2015.04.01 (රු)
මහන යන්ත්‍ර - ධාරණ අගය	450 000	500 000
අමුද්‍රව්‍ය	41 000	43 000
කලින් ලද සාමාජික මුදල්	15 000	20 000
හිඟ සාමාජික මුදල්	30 000	10 000

4. මසා නිමි බෑග් 200ක් 2015.04.01 දිනට තිබූ අතර, ඒකක නිෂ්පාදන පිරිවැය රු 300කි. 2016.03.31 දිනට ඉතිරි බෑග් ගණන 400 කි.
5. වර්ෂය තුළ නිපදවන ලද මුළු බෑග් සංඛ්‍යාව ඒකක 2020කි.
6. එක් බෑගයක් නිම කිරීම සඳහා සේවිකාවකට රු 50ක් ගෙවනු ලැබේ. වර්ෂය තුළ මෙතෙක් මේ සඳහා ගෙවීම් කර නැත.
7. පරිපාලන වියදම්වලින් 1/3ක් මැහුම් හළට අදාළ වේ.
8. බෑගයක විකුණුම් මිල රු 450කි.

අවශ්‍ය වන්නේ :

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ සකස් කිරීම

1. මැහුම් හලේ නිෂ්පාදන ගිණුම
2. මැහුම් හලේ ආදායම් ප්‍රකාශනය
3. කාන්තා සංගමයේ ආදායම් හා වියදම් ගිණුම **(ලකුණු 10 යි)**

(මුළු ලකුණු 15 යි)

* * *